(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 77.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 ජූනි මස 10 වැනි සිකුරාදා පූ. භා. 10.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** විදේශ රැකියා අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** මුදල් අමාත්‍යතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **දයා ගමගේ මහතා,** ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **රිසාඩ් බදියුදීන් මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා

ගරු **අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** ආපදා කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා,** අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා

ගරු **චන්දිම වීරක්කොඩි මහතා,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **මලික් සමරවික්‍රම මහතා,** සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා

ගරු **ඩී. එම්. ස්වාමිනාදන් මහතා,** බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා,** ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. ඒකනායක මහතා,** ඉඩම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිරෝෂන් පෙරේරා මහතා,** ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිලිප් වෙදආරච්චි මහතා,** ධීවර හා ජලජ සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** ජාත්‍යන්තර වෙළඳ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා,** පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. එච්. එම්. ෆවුසි මහතා,** ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරානාත් බස්නායක මහතා,** විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉරාන් වික්‍රමරත්න මහතා,** රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අමීර් අලි සිහාබ්දීන් මහතා,** ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු සිසිර කුමාර අබේසේකර මහතා

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු රංජිත් අලුවිහාරේ මහතා

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු බන්දුල ගුණවර්ධන මහතා

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මයන්ත දිසානායක මහතා

ගරු විමලවීර දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු තිලක් මාරපන මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු වමල් රාජපක්ෂ මහතා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු සිවශක්ති ආනන්දන් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු කනක හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. කථානායකතුමාගේ නිවේදන :** කථානායකතුමා විසින් මතු පළවන නිවේදන කරන ලදී,—

"ගරු මන්ත්‍රීවරුනි, 2016 මැයි මස 05 වැනි දින විවාදයට ගන්නා ලද රුපියල් මිලියන 55ක් සඳහා වූ පරිපූරක මුදල පිළිබඳ එදින න්‍යාය පත්‍රයේ අංක 1 වශයෙන් සඳහන් වූ යෝජනාව පිළිබඳ පැවැත්වූ ඡන්ද විමසීමේ ප්‍රතිඵලය පිළිබඳව ඇතිවූ ව්‍යාකූල තත්ත්වය සම්බන්ධයෙන් ඊයේ දින පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී සාකච්ඡා කරන ලද අතර, මා විසින් මේ පිළිබඳව විමර්ශනයක් පැවැත්වීමට පත් කරන ලද විපක්ෂ නායක ගරු රාජවරෝදියම් සම්පන්දන්, හිටපු කථානායක ගරු චමල් රාජපක්ෂ, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය ගරු රවුෆ් හකීම් සහ අධිකරණ අමාත්‍ය සහ බුද්ධශාසන අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ යන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ගෙන් සැදුම්ලත් කමිටුවේ පූර්ණ වාර්තාව මා වෙත ලබා දෙන ලදී.

එම වාර්තාවට අනුව සඳහන් වන්නේ අදාළ දිනයේදී පස්වරු 6.30ට නියමිතව තිබූ ඡන්දය පස්වරු 5.45ට කැඳවීමෙන් පසු ඡන්දය දීම සඳහා මන්ත්‍රීවරුන් සභාවට ඡන්දය ගණන් කරන අතරතුර අවස්ථා ගණනකදී පැමිණීම නිසා ඇති වූ කලබලකාරී තත්ත්වය හමුවේ අවස්ථා තුනකදී එසේ ප්‍රමාද වී පැමිණි මන්ත්‍රීවරුගේ ඡන්දය ගණන් කිරීමට අවකාශ සලසා දීමේදී යම් මානුෂික අත් වැරැද්දක් හෝ ප්‍රමාද දෝෂයක් සිදුවීමට අවස්ථාව තිබූ බවයි. එනමුත්, මෙමඟින් එම අවස්ථාවේ මූලාසනයේ සිටි මන්ත්‍රීතුමාගේ හෝ මහ ලේකම්වරයාගේ අපක්ෂපාතීත්වය හෝ ස්වාධීනත්වය පිළිබඳව කිසිම ආකාරයක සැකයක් හෝ අවිශ්වාසයක් ඇතිවීමට කිසිම හේතු සාධකයක් නොමැති බවද ගරු පරීක්ෂණ කමිටුව අවධාරණය කොට ඇත.

තවද, පරීක්ෂණ කමිටුව පහත සඳහන් කරුණු අවධාරණය කොට ඇත:

" **General Observation**

The Committee is of the view that during the last few months the conduct of some Members had been unruly, aggressive and hostile. If there will be a continuation of this kind of conduct, there will be an erosion of public confidence reposed in the Parliament and the democratic system of governance. Such a situation might eventually eat into the vitals of the democratic principles and norms. Hence the Committee recommends that stringent measures should be taken to uphold the discipline and to maintain the decorum of the Parliament.

**Recommendations**

i. The Committee recommends that this is a noteworthy matter to be resolved, by a discussion at the Party Leaders' Meeting in the interests of the Parliamentary system. If no consensus is arrived at, in considering circumstances under which the uncertainty has arisen, we recommend to hold a fresh counting of vote. (Noted a fresh vote was held.)

ii. When a Bill or a Resolution is presented to the Parliament, the Minister in charge of the subject concerned (including the officials) shall act in due diligence and appraise the House with clarity the nature and the purpose of the Bill or Resolution.

iii. The ringing of Division Bell to indicate the voting of Members must be continued for five minutes.

iv. When voting had been fixed at a particular time, the House shall not commence voting before the fixed time even if the Debate is concluded. The House may be adjourned till the time fixed for voting.

v. At the time of voting, in the absence of the Speaker, the Deputy Speaker shall preside and conduct the voting in the House.

vi. Members of the Speaker's Panel shall be given a special training to develop their skills.

vii. Officials of the Parliament shall not engage with the Members or any outsider to evaluate or examine the conduct in the House or any other related matter unless there shall be a direction from the Speaker.

viii. Stringent measures should be taken to uphold the discipline and to maintain the decorum of the Parliament.

ix. The existing Standing Orders may be revised appropriately to meet the above-mentioned requirement"

මේ සිද්ධිය පිළිබඳව මහලේකම්වරයා විසින් තම කනගාටුව මා වෙත ලිඛිතව ප්‍රකාශ කොට ඇති බවද දන්වනු කැමැත්තෙමි.

තවද, ඊයේ රැස් වූ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීන් විසින් අත්සන් කරන ලද මහලේකම්වරයාට එරෙහිව දෝෂාභියෝගය ගැනද සාකච්ඡා වූ අතර, එවැනි දෝෂාභියෝගයක් ගෙන ඒමට කිසිදු හේතු සාධකයක් ඉදිරිපත් වී නැති බව ද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අදහස විය. තවද, මෙවැනි සිදුවීම් අප පාර්ලිමේන්තුවේත්, ලෝකයේ අනෙකුත් පාර්ලිමේන්තුවලත් සිදු වූ අවස්ථා බොහෝ ගණනක් වාර්තා වී ඇත. දැනට හැන්සාඩ් වාර්තාවල සඳහන් වන පරිදි, අප පාර්ලිමේන්තුවේ අවස්ථා තුනකදී මෙවැනි අත්වැරදීම් පසුකාලීනව නිවැරදි කොට ඇත. මහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ අවස්ථා 11කදී ඡන්දය ගැනීමේදී සිදු වූ වැරදීම් සහ අඩුපාඩු නිවැරදි කොට ඇත. එබැවින්, මෙවැනි සිද්ධියක් ලෝකයේ පාර්ලිමේන්තුවක සිදු වූ පළමු අවස්ථාව යැයි හුවා දැක්වීමට සමහර මන්ත්‍රීවරු ගන්නා උත්සාහය මා තරයේ ප්‍රතික්ෂේප කරමි. එමෙන්ම, එම සිද්ධිය ඇති වූ අවස්ථාවේ ගරු සිසිර ජයකොඩි මහතා සහ ගරු විමල් වීරවංශ මහතා ඔවුන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙනුත් කනගාටුව මා වෙත පළ කර සිටින ලද බවත් දන්වනු කැමැත්තෙමි. කෙසේ වුවද, පාර්ලිමේන්තුවේ ඡන්දයක් ගන්නා අවස්ථාවන්වලදී ඒ සඳහා සියලු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අත්‍යවශ්‍ය වන බව අවධාරණය කරන අතර, මහලේකම් මණ්ඩලය විසින් ඉතා සුපරීක්ෂාකාරීව මූලාසනයේ සහයෝගය ඇතිව ඡන්දය ගණන් කිරීමට පියවර ගත යුතු බව ද අවධාරණය කරමි."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2016 වර්ෂය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4) වගන්තියට අනුව මුදල් කොමිෂන් සභාවෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත කෙරෙන නිර්දේශ පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතු යැයි යෝජනා කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා එම වාර්තාව ආර්ථික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව පිළිගන්වා එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා විසින් 2012 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින් 2015 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළිගන්වා එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2013 වර්ෂය සඳහා පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව පිළිගන්වා එම වාර්තාව බලශක්තිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2014 සහ 2015 වර්ෂ සඳහා ආනයන හා අපනයන (පාලන) දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තා පිළිගන්වා එම වාර්තා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පෙත්සම් :**

(1) (i) වඳුරඹ, නාත්තවෙල, මීනුවන්දෙනිය යන ලිපිනයෙහි පදිංචි ඒ. ජී. සෝමරත්න මහතාගෙන් ලැබුණු 2015.12.12 දිනැති පෙත්සම;

(ii) ගාල්ල, කලේගාන, පළාත් සභා දේශීය වෛද්‍ය උදාන ව්‍යාපෘතියෙහි සේවය කරන වෛද්‍ය එම්. ඩී. අසංග රංජන මහතාගෙන් ලැබුණු 2016.03.21 දිනැති පෙත්සම;

(iii) ගාල්ල, අංකොක්කාවල යන ලිපිනයෙහි පදිංචි ජී. ධර්මදාස මතෝගල කනත්ත මහතාගෙන් ලැබුණු 2016.03.27 දිනැති පෙත්සම;

(iv) හික්කඩුව, වැල්ලවත්ත, අංක 16 දරන ස්ථානයෙහි පදිංචි ජී. ඩබ්ලිව්. පී. චන්ද්‍රවංශ මහතාගෙන් ලැබුණු 2015.09.27 දිනැති පෙත්සම;

(v) අහංගම, කතළුව, ගිනිවැල්ල යන ලිපිනයෙහි පදිංචි එච්. ජී. චන්ද්‍රපාල මහත්මියගෙන් ලැබුණු 2015.12.01 දිනැති පෙත්සම;

(vi) බද්දේගම, පිටවිටගොඩ, හික්කඩුව නයාපාමුල පිවිසුම් මාර්ගය යන ලිපිනයෙහි පදිංචි කේ. එම්. ජී. නිමල් කරුණාතිලක මහතාගෙන් ලැබුණු 2015.08.07 දිනැති පෙත්සම;

(vii) බූස්ස, මහනෑගොඩ, හදනගොඩවත්ත, "අභිදිසානි" යන ලිපිනයෙහි පදිංචි එම්. ටීමන් ද සිල්වා මහතාගෙන් ලැබුණු 2015.10.14 දිනැති පෙත්සම;

(viii) බලපිටිය, වැලිකඩමුල්ල යන ලිපිනයෙහි පදිංචි එම්. එම්. කේ. සී. ජයවිලාල් මහතාගෙන් ලැබුණු 2015.09.22 දිනැති පෙත්සම;

(ix) රත්මලාන, අත්තිඩිය පාර, සෙත්සිරි මාවත, අංක 34 බී දරන ස්ථානයෙහි පදිංචි එම්. ටී. එම්. නිසාර් මහතාගෙන් ලැබුණු 2016.02.24 දිනැති පෙත්සම;

(x) ගාල්ල, කරාපිටිය, සනිසයිඩ් ගාඩ්න්ස්, අංක 247/45 දරන ස්ථානයෙහි පදිංචි පී.ජේ. රූපසිංහ මහතාගෙන් ලැබුණු 2015.09.24 දිනැති පෙත්සම;

(xi) බටපොළ, කහටපිටිය, යෝගාශ්‍රමය පාර යන ලිපිනයෙහි පදිංචි පී .එස්. රුක්මනී ඩයස් මහත්මියගෙන් ලැබුණු 2015.09.27 දිනැති පෙත්සම;

(xii) තඹුත්තේගම, අංක 352, තේක්කවත්ත, "අමා සුව අරණ" භාවනා මධ්‍යස්ථානය යන ලිපිනයේ වැඩ වසන පූජ්‍ය ටී. සද්ධම්මවාලා තෙරණියගෙන් ලැබුණු 2016.02.29 දිනැති පෙත්සම; සහ

(xiii) ගිංතොට, දඩල්ල, බෝගහවත්ත, අංක 70/9/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්. ෂෙල්ටන් මහතාගෙන් ලැබුණු 2016.03.21 දිනැති පෙත්සම

ගරු වජිර අබේවර්ධන මහතා විසින් පිළිගන්වන ලදී.

(2) එරාවූර් 03, ජෙයාන්හරි, රියාස් බේකරි පාර යන ලිපිනයෙහි පදිංචි කොල්සම් බීවී මර්සුක් මහත්මියගෙන් ලැබුණු 2015.10.05 දිනැති පෙත්සම ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) කිරිදිවැල, මිල්ලතේ, කිරිවැලේවත්ත, අංක 116/F දරන ස්ථානයෙහි පදිංචි බී. ජී. ඩබ්ලිව්. ජයසිංහ මහතාගෙන් ලැබුණු 2016.02.07 දිනැති පෙත්සම;

(ii) මහනුවර, අම්පිටිය, පල්ලේගම, අංක 48/3 ඒ දරන ස්ථානයෙහි පදිංචි බී. අයි. ජී. සම්පත් ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2016.02.18 දිනැති පෙත්සම;

(iii) මල්වාන, කළුකොඳයාව, අංක 76 දරන ස්ථානයෙහි පදිංචි එස්. ඒ. කුමාරසිංහ මහතාගෙන් ලැබුණු 2016.03.07 දිනැති පෙත්සම;

(iv) කිරිදිවැල, බෝගහවත්ත, හත්පෙරුම, අංක 200/A/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. කරුණාසේන මහතාගෙන් ලැබුණු 2016.02.23 දිනැති පෙත්සම; සහ

(v) වේයන්ගොඩ, මගලේගොඩ, අංක 194/35 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. පී. සහන් පතිරාජ මහතාගෙන් ලැබුණු 2016.02.26 දිනැති පෙත්සම

ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) :** මුදල් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව,— 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2016 ජූනි මස 21 වැනි අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතුයැයි ද, එය මුද්‍රණය කළ යුතුයැයි ද නියෝග කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුව විසින් 2016.03.08 වැනි දින සම්මත කරන ලද යෝජනාවේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 10.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද විය යුතු ය. පූ. භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 7(5) ඡේදය ක්‍රියාත්මක විය යුතු ය. අ. භා. 6.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල්තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු මොහොමඩ් නවවි මහතා, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"අමීර් අලි පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**7. පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය :** ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය, ගරු මොහොමඩ් නවවි මහතා විසින් ස්ථිර කරනු ලබමින් ඉදිරිපත් කළ යෝජනාව,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ළමා සංවර්ධන සංගමය (SLACD) සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව, පළමුවැනි වර කියවන ලදින්, මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

අංක 47(5) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ වාර්තා කිරීම පිණිස පනත් කෙටුම්පත සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙත පවරන ලදී.

**8. කල් තැබීම (හමුදාව අත්පත් කර ගෙන ඇති උතුරු-නැගෙනහිර ඉඩම් නිදහස් කිරීම හා අවතැන්වූවන් සඳහා ව්‍යුහාත්මක වැඩසටහන්) :** ''මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය''යි පාර්ලිමේන්තුවේ සභානායකතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

''ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය''යි ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 1.20 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

''ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය යුතුය''යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 2.14 ට ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.)

''ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය''යි උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.00 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

''ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය යුතුය''යි ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 4.16 ට ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.)

''ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය යුතුය''යි ගරු සෙය්යිඩ් අලී සහීර් මවුලානා මහතා, ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා ස්ථිර කරමින් යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 5.32 ට ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 6.30 පසුකර තිබූයෙන් අ. භා. 6.53 ට මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2016 ජූනි මස 21 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් කල් ගියේය.